**පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය - 2015**

**-----------------------------------------------------**

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය,හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2003 අංක 9 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 50(3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**-----------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**----------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්වය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය

මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ජංගම නොවන වත්කම් සඳහා වූ ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු. 13,875,000 ක් වූ වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

### 2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම.

පහත සඳහන් නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ යනාදියට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) 2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 19 (2) වගන්තිය | පාරිභෝගික සභාව වෙත විමර්ශනය සඳහා යොමු කළ කරුණක් මාස 02 ක් ඇතුළත විමර්ශනය කර එකී වාර්තාව අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළ යුතු වුවද, දිවයින පුරා පිහිටි පෞද්ගලික සෞඛ්‍ය සේවා ආයතන මගින් රෝගීන් සඳහා සිදුකරන රසායනාගාර පරීක්ෂණ සහ වෛද්‍ය උපදේශන සේවා සඳහා අධික ගාස්තු අය කිරීම සම්බන්ධව විමර්ශණය කිරීම සඳහා පාරිභෝගික සභාව වෙත යොමු කර තිබුණද, එම විමර්ශන වාර්තාව විගණිත දිනය වූ 2016 ජුනි 15 දින දක්වා ඉදිරිපත් වී නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 4.5 වගන්තිය | සේවයෙන් ඉවත්ව ගිය නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු.10,119 ක් වූ ණය ශේෂය හා වැඩ තහනම් කරන ලද නිලධාරීන් 04 දෙනෙකුගෙන් අයවිය යුතු රු.324,616 ක් වූ ණය ශේෂ 2015 දෙසැම්බර් 31 දින වනවිටත් ඇපකරුගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1. මූල්‍ය ප්‍රතිඵලය**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා අධිකාරියේ මූල්‍ය ප්‍රතිඵලය රු.12,730,639 ක අතිරික්තයක් වූ අතර එයට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.23,184,968 ක් වූයෙන් ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේදී මූල්‍ය ප්‍රතිඵලයේ රු. 10,454,329 ක පිරිහීමක් නිරීක්ෂණය විය. පුනරාවර්තන ප්‍රදාන රු.37,674,564 කින් හා අනෙකුත් ආදායම් රු.11,174,528 කින් වැඩිවී තිබුණද, පෞද්ගලික පඩිනඩි රු.58,167,187 කින් හා වැඩිවීම ඉහත පිරිහීම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී සමාලෝචිත වර්ෂය දක්වා අඛණ්ඩ මූල්‍ය අතිරික්තයක් පැවති නමුදු එය වාර්ෂිකව උච්චාවචනය වී තිබුණි. කෙසේ වුවද සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය සැලකීමේදී 2011 වර්ෂයේදී රු.131,429,112 ක්වූ ආයතනයේ දායකත්වය අඛණ්ඩව වර්ධනය වී 2015 වර්ෂයේදී එය රු.262,287,710 ක් විය.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1. කාර්ය සාධනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරි පනත අනුව අධිකාරියේ අරමුණු පහත පරිදි වේ.

- පාරිභෝගිකයන්ගේ ජීවිත හා දේපල වලට උපද්‍රවයන් සිදුවන භාණ්ඩ අලෙවි කිරීමට සහ සේවා සැපයීමට එරෙහිව පාරිභෝගිකයන් ආරක්ෂා කිරීම.

- අසාධාරණ වෙළඳ පිළිවෙත් වලට විරුද්ධව පාරිභෝගිකයන් ආරක්ෂා කිරීම සහ පාරිභෝගිකයන්ගේ අයිතිවාසිකම් වලට නිසි සැලකිල්ල දැක්වීමට සහතික වීම.

- හැකි සෑම විටම පාරිභෝගිකයන්ට තරඟකාරී මිලට භාණ්ඩ සහ සේවා වලට ප්‍රමාණවත් ප්‍රවේශයන් ලබා දීමට සහතික වීම සහ

- අසාධාරණ වෙළඳ පිළිවෙත් සීමිත වෙළඳ පිළිවෙත් හෝ වෙළෙන්දන් විසින් සිදුකරන වෙනත් යම් ආකාරයක පාරිභෝගික සූරාකෑම් වලට එරෙහිව සහනයක් ලබාදීම.

සමාලෝචිත වර්ෂය තුළ අධිකාරිය විසින් ඉහත අරමුණු ඉටුකර ගැනීමේදී පහත අඩුපාඩු නිරීක්ෂණය විය.

**(අ) බටහිර ඖෂධ සඳහා මිල පාලනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) 2014 මාර්තු 04 දිනැති අංක 1852/22 දරන අති විශේෂ ගැසට් නිවේදනය මගින් සියලුම ඖෂධ "නිශ්චිත භාණ්ඩයක්" බවට පත් කර තිබූ අතර ඒ අනුව අධිකාරිය පිහිටුවීමේ පනතේ 18 (2) වගන්තිය ප්‍රකාරව ඖෂධ මිල වැඩි කිරීමට ප්‍රථම අධිකාරියේ අනුමැතිය ලබා ගත යුතු විය. ඖෂධ විකිණිය හැකි මිල තීරුබදු රහිත ආනයන මිලෙන් (C.I.F) සියයට 65 ක උපරිමයක් දක්වා සීමා කිරීමේ ක්‍රමවේදයක් අධිකාරියේ පැවතුනද ඖෂධ නිශ්චිත භාණ්ඩයක් බවට පත් කිරීමේ ගැසට් නිවේදනය නිකුත් වීමට පෙර සමාගම් විශාල ප්‍රමාණයක් සියයට 65 සිට 937 දක්වා පරාසයකින්

ඖෂධ මිල වැඩි කරගෙන තිබූ නමුත් එම වැඩිකළ මිල නැවත සියයට 65 දක්වා අඩු කිරීම සඳහා අධිකාරිය වෙත පාරිභෝගික අධිකාරි පනතින් බලතල ලැබී නොතිබුණි.

(ii) රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව සහ ඖෂධ විකිණීමේ යෙදී සිටින සමාගම් ආනයනය කළ ඖෂධ සඳහා මිල වැඩි කර ගැනීමට අධිකාරියේ අවසර ඉල්ලා තිබුණි. රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව තීරුබදු රහිත ආනයන මිලෙන් සියයට 50 සිට 53 අතර පරාසයකින්ද අනිකුත් ඖෂධ විකිණීමේ යෙදී සිටින සමාගම් තීරුබදු රහිත ආනයන මිලෙන් සියයට 62 සිට 64 අතර පරාසයක පිහිටන පරිදි තම සිල්ලර මිල සකස් කර එකී සිල්ලර මිල වෙළඳපලේ ක්‍රියාත්මක කිරීමට අධිකාරියේ අවසරය ලබාගෙන තිබුණි. මෙහිදී ඖෂධ නීතිගත සංස්ථාව සහ ඖෂධ විකිණීමේ යෙදී සිටින අනිකුත් සමාගම් සඳහා එකම මිල පරාසයක් ක්‍රියාත්මක නොකර ඖෂධ සමාගම් සඳහා පමණක් ඉහළ සිල්ලර මිලක් පවත්වා ගෙන යාමට අනුමැතිය ලබාදී තිබුණි.

**(ආ) පෞද්ගලික සෞඛ්‍ය සේවා ආයතන සිදුකරන සේවා**

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) 2015 ජූනි 11 දිනැති අංක 1918/17 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් සියලු පෞද්ගලික සෞඛ්‍ය සේවා ආයතනවලින් අභ්‍යන්තර ප්‍රතිකාර ගන්නා රෝගීන් වෙත ලබා දෙන ඖෂධ සහ එකී රෝගීන්ට ප්‍රතිකාර කිරීමේදී භාවිතා කළ සියළු වෛද්‍ය උපකරණ හා ඒවා භාවිතා කළ ප්‍රමාණ සම්බන්ධයෙන් විස්තරාත්මක පිරිවැය අඩංගු තොරතුරු ඇතුළත් බිල්පත් නිකුත් කළ යුතු බවට නියමයන් පනවා තිබුණි. නමුත් 2016 ජූනි 15 දින වන විටත් එම නියමයන් නිසි ලෙස ක්‍රියාත්මකවේදැයි පරීක්ෂා කර බැලීමට අධිකාරිය පියවර ගෙන නොතිබුණි.

(ii) දිවයින පුරා පිහිටි පෞද්ගලික රෝහල් මගින් වැඩිපුරම සිදු කරන රසායනාගාර පරීක්ෂණ 33 ක් සඳහා සෞඛ්‍ය සේවා නියාමන අධිකාරිය මගින් පැනවූ අවම සහ උපරිම මිල අතර විශාල පරතරයක් පැවතුණි. මේ අනුව එම ආයතනවලට රෝගීන්ගෙන් උපරිම මිල ගණන් අයකර ගැනීමට හැකියාව ලැබී තිබුණි. නමුත් පාරිභෝගිකයන් ආරක්ෂා කිරීම වෙනුවෙන් මේ සඳහා අධිකාරියේ මැදිහත් වීමක් සිදුවී නොතිබුණි.

**(ඇ) සහල් සඳහා මිල පාලනය**

---

සමාලෝචිත වර්ෂයේදී රජය මගින් කීරි සම්බා හා සම්බා වී කිලෝවක් සඳහා රු.50 කද, නාඩු වී කිලෝවක් සඳහා රු.45 කද සහතික මිලක් පනවා තිබුණි. එම මිල මත පදනම්ව අධිකාරිය විසින් සහල් සඳහා පාලන මිලක් පනවා නොතිබුණු බැවින් වෙළඳපලේ සහල් මිල ගණන් ඉහළ ගොස් තිබුණි.

**(ඈ) ළදරු කිරි ආහාර මිල පාලනය**

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ළදරු කිරි ආහාරවල මිල ගණන් පාලනය කිරීම සඳහා 2012 ජූනි 18 දින නිකුත් කළ අංක 1763/4 දරන අති විශේෂ ගැසට් පත්‍රයෙහි පැවති අඩුපාඩු හේතුවෙන් නව ගැසට් නිවේදනයක් නිකුත් කරන ලෙසට 2013 ජනවාරි 04 දින නීතිපති දෙපාර්තමේන්තුව, අධිකාරිය වෙත දැනුම් දී තිබුණි. ඒ අනුව 2013 ජූලි 10 දින අංක 1818/11 දරන ගැසට් නිවේදනය මගින් ඉහත ගැසට් නිවේදනය පරිච්ඡින්න කර තිබුණද මෙම කරුණ නැවත විමර්ශනය කර නව ගැසට් නිවේදනයක් නිකුත් කර මිල පාලනය කිරීමට අධිකාරිය පියවර ගෙන නොතිබුණි.

(ii) ඉහත ගැසට් නිවේදනය ඉවත් කිරීමත් සමඟ ළදරු කිරි ආහාර ආනයනය කරන සමහර සමාගම් ආනයනික මිලට (C.I.F වටිනාකමට) සියයට 72 සිට 235 දක්වා පරාසයක සිල්ලර මිලක්

තීරණය කරමින් වෙළඳපලේ අධික ලාභ ලබමින් පැවතුණි. මෙම තත්ත්වය සම්බන්ධව මිල හා කළමනාකාරිත්ව අංශය මගින් අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තාවක් ඉදිරිපත් කර තිබුණද එය පාරිභෝගික සභාව වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(iii) ළදරු කිරි ආහාර ආනයනය කර බෙදාහැරීමේ යෙදී සිටින සමාගම් විසින් අලෙවි කරන එක් එක් කිරිපිටි වර්ගවල ආනයන මිලෙහි සිට සිල්ලර මිල දක්වා මිල සකස් වී ඇති ආකාරය පිළිබඳව ප්‍රමාණවත් තොරතුරු ලබාගෙන ඒ පිළිබඳව විමර්ෂණය කිරීමකින් තොරව ආනයනික ඉන්වොයිස් පත්‍ර හා රේගු නිශ්කාශන පත්‍ර පමණක් පදනම් කරගෙන මිල පිළිබඳ විමර්ෂණයක් කිරීමට අධිකාරිය පියවර ගෙන තිබුණි.

(ඉ) **යොදය රහිත කිරිපිටි මිල පාලනය**

------------------------------------

අධිකාරිය විසින් යොදය රහිත කිරිපිටි සඳහා පාලන මිලක් පැනවීමට විගණිත දිනය වූ 2016 ජුනි 15 දින දක්වා පියවර ගෙන නොතිබුණු බැවින් මෙම භාණ්ඩ නිෂ්පාදකයන් හා ආනයනකරුවන් අධිකාරියේ අවසරයක් නොමැතිව තමන්ගේ අභිමතය පරිදි භාණ්ඩවල මිල පවත්වාගෙන යමින් පැවතුණි.

(ඊ) **පෙට්‍රෝලියම් ගෑස් මිල පාලනය**

------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) අධිකාරිය සහ ගෑස් සමාගම් 02 අතර ඇති වූ මිල සූත්‍ර ගිවිසුම්වලට අනුව සෑම මාස 02 කට වරක් අදාළ සමාගම් විසින් කිලෝග්‍රෑම් 12.5 ක් වූ ගෘහස්ථ ගෑස් සිලින්ඩරයක මිල සකස් වී ඇති ආකාරය අධිකාරියට දැනුම් දිය යුතු අතර අධිකාරියද එය පදනම් කරගෙන දින 30 ඇතුළත මිල උච්චාවචනය සම්බන්ධව තීරණයක් ලබා දිය යුතු විය. මෙහිදී එක් සමාගමක් 2012 නොවැම්බර් මාසයෙන් පසුව සහ අනෙක් සමාගම 2015 මැයි මාසයෙන් පසුව කිසිදු තොරතුරක් අධිකාරියට ලබා දී නොතිබූ නමුත් ඒ සම්බන්ධව අධිකාරිය විසින් අධීක්ෂණ කටයුතු සිදුකර නොතිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේදී අධිකාරිය විසින් මිල සූත්‍ර ප්‍රකාරව ගෑස් මිල තීරණය කර නොතිබුණු අතර අවස්ථා 3 කදී භාණ්ඩාගාරය විසින් ගෑස් මිල තීරණය කර අධිකාරිය වෙත දැනුම්දී අධිකාරිය මගින් ගැසට් නිවේදන නිකුත් කරවා තිබුණි.

(උ) **බිස්කට් මිල පාලනය**

------------------------

සමාලෝචිත වර්ෂයේ අධිකාරියේ තරඟකාරීත්ව ප්‍රවර්ධන අංශය මගින් සිදුකළ බිස්කට් නිෂ්පාදනය පිළිබඳ අධ්‍යයනයේදී බිස්කට් කර්මාන්තයේ යෙදෙන ප්‍රධාන සමාගම් 02 ක් අලෙවිය වැඩි කර ගැනීම සඳහා තරඟකාරී ප්‍රචාරණ කටයුතුවල යෙදීමත්, සිල්ලර වෙළඳුන්ට ඉහළ වට්ටම් ලබා දීම සහ සමාගම් විසින් ඉහළ ලාභ ආන්තික පවත්වා ගැනීම නිසා බිස්කට්වල විකුණුම් මිල ඉහළ යාම සිදුවී ඇති බවටත්, සමාන බරින් යුතු සමාන වර්ගයේ නිෂ්පාදන විවිධ මිල ගණන් යටතේ පාරිභෝගිකයන්ට අලෙවි කරන බවට නිරීක්ෂණය කර තිබුණි. මේ නිසා බිස්කට් පාරිභෝගිකයන් ආරක්ෂා කිරීම වෙනුවෙන් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරි පනතට යටත් කර නිශ්චිත භාණ්ඩයක් බවට පත් කළ යුතු බවට එකී අධ්‍යයන වාර්තාවෙන් නිර්දේශ කර තිබුණත් පාරිභෝගික අධිකාරි පනතේ 19 වැනි වගන්තිය ප්‍රකාරව අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් මෙම කරුණ විමර්ශනය කිරීම සඳහා පාරිභෝගික සභාව වෙත යොමු කර නොතිබුණි.

(ඌ) **ත්‍රිරෝද රථ ගාස්තු පාලනය**

------------------------------

ත්‍රිරෝද රථ රියදුරන් ප්‍රමිතියෙන් තොර මීටර් සවි කිරීම සහ මීටරය මගින් පෙන්වන ගාස්තුව ගමන් කළ දුර අනුව සාධාරණ නොවීම, එකම දුරට එක් එක් රියදුරන් විවිධ ගාස්තු අය කිරීම, වැසි සහිත දිනවල සහ රාත්‍රී කාලයේ වැඩිපුර ගාස්තු අය කිරීම සහ ඉන්ධන මිල අඩු වුවත් ගාස්තු අඩු නොකිරීම

යන කරුණු නිසා ත්‍රීවීල් භාවිතා කරන පාරිභෝගිකයන්ගෙන් අසාධාරණ ගාස්තු අය කරමින් පැවතුණි. පාරිභෝගිකයන් වෙත සේවා සැපයීමකදී යම් ආකාරයකට පාරිභෝගික සූරාකෑම් සිදුවන විටදී සහ අසාධාරණ මිලක් පවත්වා ගෙන යාම තුලින් එය වැඩි පාරිභෝගික කණ්ඩායමක් කෙරෙහි සැලකිය යුතු ආකාරයට බලපාන විටදී මේ සම්බන්ධව අධිකාරිය විසින් විමර්ශනයක් සිදු කර නීති රීති නිකුත්කර පාරිභෝගිකයන් ආරක්ෂා කිරීම කළ යුතු වුවත් එසේ සිදු කර නොතිබුණි.

**(එ) පානීය ජල බෝතල් සඳහා මිල පාලනය**

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) පාරිභෝගිකයන්ගේ සෞඛ්‍ය ආරක්ෂාවට යම් හානියන් සිදුවිය හැකි භාණ්ඩ සම්බන්ධයෙන් මැදිහත් වීමට අධිකාරියට පනතින් හිමිව ඇති බලතල ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේදී දිවයිනේ විවිධ ප්‍රදේශවලින් ලබා ගත් පානීය ජල බෝතල් 29 ක් රසායනික හා භෞතික පරීක්ෂාව සඳහා රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව වෙත යොමු කර තිබූ අතර එයින් ජල බෝතල් 25 ක්ම ආහාර පනතට අනුව ප්‍රමිතියෙන් තොර බවට 2015 ජූලි මාසයේ ලැබුණු වාර්තාව මගින් සනාථ වී තිබුණි. එම අඩුපාඩු පිළිබඳව සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා වහාම දැනුවත් කළ යුතු වුවත්, වාර්තාව ලැබී මාස 07ක් ගතවීමෙන් පසු සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත දැනුම් දී තිබුණු අතර මේ සම්බන්ධව නෛතික ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ii) ජල බෝතල් සම්බන්ධයෙන් මිල පාලනයක් සිදු කිරීම සඳහා අධිකාරියේ පාරිභෝගික කටයුතු සභාව විසින් සිදුකර තිබුණු විමර්ශනයට අදාළව 2014 ජූලි 30 දින අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් වෙත භාරදී තිබුණු විමර්ශන වාර්තාවෙන් ඒ ඒ ජල පරිමාවෙන් යුතු බෝතල් සඳහා තැබිය යුතු උපරිම සිල්ලර මිල සම්බන්ධව නිර්දේශ ඉදිරිපත් කර තිබුණි. එසේ වුවත් විගණිත දිනය වූ 2016 ජූනි 15 දින වන විටත් ජල බෝතල් සම්බන්ධයෙන් මිල පාලනය කිරීමට පියවර ගෙන නොතිබුණි.

**(ඒ) තිරිඟු පිටි මිල පාලනය**

---

2014 මැයි 26 දිනැති අංක 1342/1 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් තිරිඟු පිටි නිශ්චිත භාණ්ඩයක් බවට පත් කර අධිකාරියේ මිල පාලනයට යටත් කර තිබුණු අතර 2015 මාර්තු 19 දිනැති අංක 1906/47 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් පැකට් නොකරන ලද තිරිඟු පිටි සඳහා පමණක් කිලෝග්‍රෑම් 01 ක මිල රු. 87 ක් ලෙස නියම කර තිබුණි. ඒ හේතුවෙන් වෙළඳපලේ පැකට් කරන ලද තිරිඟු පිටි කිලෝග්‍රෑම් 01 ක මිල රු. 108 සිට රු. 115 දක්වා මිල පරාසයක අලෙවි කරමින් පැවතියද, පැකට් කරන ලද තිරිඟු පිටි සඳහා මිල පාලනයක් සිදු කිරීමට 2016 ජූනි 15 දින වන විටත් අධිකාරිය පියවර ගෙන නොතිබුණි.

**(ඔ) පාරිභෝගික සේවා විමසුම් ව්‍යාපෘතිය**

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) පාරිභෝගිකයන්ට අධිකාරිය වෙත ක්ෂණිකව පැමිණිලි ඉදිරිපත් කිරීම සහ පාරිභෝගිකයන්ට හා ගොවීන්ට වෙළඳපලේ තොග හා සිල්ලර මිල ගණන් දැනගැනීම සඳහා 2013 හා 2014 වර්ෂවලදී රු. 9,188,369 ක් වැයකර ස්ථාපිත කර තිබුණු 1977 - පාරිභෝගික සේවා විමසුම් ව්‍යාපෘතිය හරහා පැමිණිලි ඉදිරිපත් කිරීමේදී අධිකාරියේ නිලධාරියෙකු ක්ෂණිකව සම්බන්ධ කර ගැනීමට නොහැකි වීමත්, ලැබෙන පැමිණිලි පටිගතවීම සඳහා යොමු වීමත්, හා ඒ සඳහා පාරිභෝගිකයින් දැක්වූ අකමැත්ත හේතුවෙන් මෙම ක්‍රමය යටතේ පාරිභෝගික පැමිණිලි ඉදිරිපත් කිරීම අසාර්ථක වී තිබුණි.

(ii) මෙම හදිසි ඇමතුම් අංකය හරහා පාරිභෝගිකයින්ට හා ගොවීන්ට ආර්ථික මධ්‍යස්ථාන 07 ක, ප්‍රධාන වෙළඳපල 05 ක සහ ලංකා සතොස ආයතනයේ යාවත්කාලීන කරන ලද තොග සහ සිල්ලර මිල ගණන් ලබා ගැනීමේ පහසුකම් සැපයීම ව්‍යාපෘතියේ අරමුණක් වී තිබුණද, ආර්ථික මධ්‍යස්ථානවල සහ ලංකා සතොස ආයතනයේ වෙළඳපල මිල ගණන් යාවත්කාලීන නොකිරීම හා පද්ධතියේ පවතින විවිධ දෝෂයන් නිසා ප්‍රධාන වෙළඳපල 05 න් ලබා ගන්නා දත්ත පාරිභෝගිකයන්ට ලබා ගැනීමට නොහැකි වූ අවස්ථා පැවතීම හේතුවෙන් ඉහත අරමුණු ඉටුවී නොතිබුණි.

(ඕ) 2014 වර්ෂය හා සැසඳීමේදී 2015 වර්ෂයේ වැටලීම් සංඛ්‍යාව සියයට 3 කින් අඩු වී තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ ඉලක්කගත වැටලීම් සංඛ්‍යාවට වඩා තථ්‍ය වැටලීම් සංඛ්‍යාව 4296 ක් හෙවත් සියයට 17 කින් අඩු වී තිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අසාධාරණ වෙළඳ පිළිවෙත්වලට විරුද්ධව හා පාරිභෝගික අයිතිවාසිකම් ආරක්ෂා කිරීම්වලට අදාළව ආයතනයේ අරමුණු ඉටුකර ගැනීමට සැලසුම් කිරීම හා ඒවා ක්‍රියාවට නැංවීම වෙනුවෙන් ආයතනයේ අරමුදල් ප්‍රශස්ථ අයුරින් යොදා ගතයුතු වුවත් අධිකාරියේ දඩ මුදල් වලින් 2015 සැප්තැම්බර් 30 දින දක්වා රැස්කර තිබුණු රු.4,400,000 ක්වූ අතිරික්ත මුදල් ආයතනයේ අරමුණු ළගාකර ගැනීමට යොදා නොගෙන බැංකු ජංගම ගිණුමේ රඳවාගෙන තිබුණි.

(ආ) 2013 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා අධිකාරියේ විදේශ සංචාර සඳහා සහභාගී වූ නිලධාරීන්ගෙන් අවස්ථා කිහිපයක් සඳහා එකම නිලධාරී කණ්ඩායමක් සහභාගී වීමේ ප්‍රවණතාවයක් නිරීක්ෂණය වූ අතර විදේශ සංචාර සඳහා නිලධාරීන් තෝරා ගැනීමේදී අදාළ සංචාරයේ ස්වභාවය අනුව සුදුසුකම් ලත් නිලධාරීන් අතර අවස්ථාවන් බෙදී යන ආකාරයට තෝරා ගැනීම් සිදුකර නොතිබුණි.

## 5. පද්ධති හා පාලනයන්

විගණනයේදී අනාවරණය වූ පද්ධති හා පාලන පිළිබඳ අඩුපාඩු වරින්වර අධිකාරියේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍රය | නිරීක්ෂණය |
|---|---|
| (අ) වාහන පාලනය | කුලී වාහන සැපයුම්කරුවන් තෝරා ගැනීමේ දුර්වලතාවයන් පැවතීම හා ඌන උපයෝජිත වාහන පැවතීම. |
| (ආ) සේවක ණය පාලනය | සේවක ණය අයකර ගැනීමේදී ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුගමනය නොකිරීම, සේවක ණය කාල විශ්ලේෂණයක් පිළියෙල නොකිරීම. |

| | | |
|---|---|---|
| (ඇ) නිශ්චිත භාණ්ඩවල මිල පාලනය | (i) | ඖෂධ නීතිගත සංස්ථාව සහ බටහිර ඖෂධ අලෙවි කරන සමාගම් සඳහා එකම මිල පරාසයක් ක්‍රියාත්මක නොවීම. |
| | (ii) | ඖෂධ නිශ්චිත භාණ්ඩයක් බවට පත් කරමින් ගැසට් නිවේදනය නිකුත් වීමට ප්‍රථම සමාගම් විශාල ප්‍රමාණයක් ඖෂධ මිල වැඩි කර ගැනීම. |
| | (iii) | ළදරු කිරි ආහාර සඳහා සිදුකළ මිල පාලනය සාර්ථක නොවීම. |
| | (iv) | සහල් සඳහා මිල පාලනයක් කිරීමට නොහැකි වීම. |
| | (v) | පැකට් කළ තිරිඟු පිටි සඳහා මිල පාලනයක් ක්‍රියාත්මක නොවීම. |